# ප්‍රජාව හා සංවර්ධනය

සෑම ආර්ථික හෝ සමාජ සංවර්ධන වැඩ පිළිවෙලකම වැදගත් අරමුණක් වන්නේ එයට අදාළ ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීමයි. මේ අයුරින් බලන විට කිරිදිඔය ව්‍යාපෘතියේ මූලික අරමුණ වන්නේද කිරිදිඔය ජලාශයෙන් සැපෙන ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීමයයි කිව හොත් නිවැරදිය. කිරිදිඔය ව්‍යාපෘති ප්‍රදේශයේ ප්‍රජාව තුළ ඇතිවන සමාජ විපර්යාසය, හා ඒ කෙරෙහි බලපාන සාධකද පරීක්ෂා කිරීම මෙම ලිපියේ අරමුණ වේ.

ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණක් වන්නේ කෘෂි නිෂ්පාදිතය ඉහළ නැංවීමයි. කෘෂි ආශ්‍රිත රැකියා සුලභ කිරීම, අලුතින්

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී
ඩී. ගමගේ විසිනි

පදිංචි කෙරෙන ගොවිපවුල්වල ආදායම් මට්ටම ඉහළ නැංවීම, ආහාර ආනයන වියදම් අඩුකොට



විදේශ විනිමය ඉතිරි කර ගැනීමද ව්‍යාපෘතියේ අනෙක් අරමුණු අතර වේ. මෙනයින් බලන කල කිරිඳිඔය ව්‍යාපෘතිය ආර්ථික දියුණුව මූල් කරගත් සංවර්ධන වැඩ පිළිවෙලකි. මේ සඳහා කෙරෙන අති විශාල ධන ආයෝජනයෙන් විශාල ප්‍රමාණයක් වැය වන්නේ වාරිමාර්ග හා ඉඩම් සංවර්ධනය මූල් කරගත් වැඩ පිළිවෙල සඳහාය. ව්‍යාපෘතිය තුල සමාජ සංවර්ධන අංශය නොසලකා හැර හෝ නොවැදගත් වේ යැයි මින් අදහස් නොකෙරේ. ප්‍රදේශය තුල මංමාවත්, අධ්‍යාපන, සෞඛ්‍ය, වෙළඳපල වැනි ප්‍රජා හා සමාජ පහසුකම් වැඩිදියුණු කිරීමටද ව්‍යාපෘතිය මගින් ඒකාබද්ධ වැඩ පිළිවෙලක් දියත් කර ඇත. මෙම ලිපියෙන් විශේෂයෙන් විමසුමට ලක්වන්නේ මෙසේ ව්‍යාපෘතියෙන් සපයන ලද සේවා සහ පහසුකම් එහි ප්‍රජා ජීවිතය කෙරෙහි බලපාන අයුරුයි.

කිරිඳිඔය ප්‍රජාව වශයෙන් මෙහිදී සලකන්නේ කිරිඳිඔය ව්‍යාපෘති ප්‍රදේශයේ හෝ ප්‍රදේශය නව ජලාශයෙන් පෝෂණය වන ප්‍රදේශය තුළ වෙසෙන ජනගහනයයි. මෙම ප්‍රජාව හඳුනා ගැනීමේ පහසුව සඳහා මූලික කොටස් දෙකකට බෙදා වෙන් කර ගත හැක. පළමුවැන්න පැරණි සංවර්ධිත ප්‍රදේශයේ වෙසෙන ජනගහනයයි. දෙවැන්න නව සංවර්ධිත ප්‍රදේශයේ ව්‍යාපෘතිය යටතේ පදිංචි කර ලද ජනගහනයයි. පැරණි සංවර්ධිත පෙදෙස යනු තිස්ස, ඒරවිල, යෝධවැව, දෙබර වැව, බදගිරිය වැනි පැරණි වැව මූල් කරගත් පෙදෙස් තුල වෙසෙන ජනගහනයයි. මොවුන් සාපේක්ෂ වශයෙන් ප්‍රදේශය තුල බොහෝ කාලයක් පදිංචිව සිටි අය හෝ ඔවුන්ගෙන් පැවත එන්නෝය. මෙනිසා ඔවුන් අතර ආර්ථික හා සමාජ සම්බන්ධතා හොඳින් මූල්බැස ගෙන ඇති බව පෙනේ. නව සංවර්ධිත ප්‍රදේශ තුල වෙසෙන කිරිඳිඔය ප්‍රජාව සාපේක්ෂ වශයෙන් ප්‍රදේශයට නවකයෝ වන අතර ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචිකර ඇත.

කිරිඳිඔය ව්‍යාපෘතිය යටතේ ගොවි ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී මූලික ක්‍රම දෙකක් යොදා ගැනුණි. එක් ක්‍රමයකට අනුව ව්‍යාපෘතියේ මැදිහත්වීමට ප්‍රථම එම ප්‍රදේශය තුල පදිංචිව සිටි අයට ප්‍රමුඛත්වයක් දී විකල්ප ඉඩම් ලබා දෙන ලදී.

දෙවෙනි ක්‍රමය වන්නේ ප්‍රදේශයෙන් පිට වෙසෙන පවුල් විවෘත පදනමක් මත තෝරා ගැනීමය. මෙහිදී "ඉඩම් නොමැතිකම" යන මූලික නිර්ණායක පදනම් කොට සම්බන්ධතොට, මාතර රත්නපුර හා මොණරාගල යන දිස්ත්‍රික්ක තුළින් ගොවි පවුල් තෝරා ගැනීමට යෙදුනි. දැනට ව්‍යාපෘතියේ නව සංවර්ධිත පෙදෙසෙහි පදිංචි හාර දහසකට ආසන්න ගොවි පවුල් වලින් හරි අඩක් පමණ මෙසේ විවෘත පදනමක් මත ඉඩම් ලැබ සංක්‍රමණය වූ ගොවි පවුල්ය. මෙසේ බලන විට ව්‍යාපෘතිය යටතේ ඉඩම් ලැබූ සියළුම ගොවි පවුල් ප්‍රදේශය තුළ නැවත පදිංචි කිරීම තුළින් ඇතිවන සමාජ, ආර්ථික, ආයතනික මෙන්ම පාරිසරික ගැටළු වලට මුහුණ දෙන අයයි. මෙවැනි නව සංජීවන ගැටළු සහිත ප්‍රජාවක ඇතිවන සමාජ විපර්යාසය ඔවුන්ගේ ජීවන තත්ත්වය සහ ඒ කෙරෙහි බලපාන කරුණුද විමසුවිට ලක් කළ යුතුය. ව්‍යාපෘතිය ආරම්භයේ සිට සමීක්ෂණ මගින් ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය මගින් ලබාගත් දැනුම් සම්භාරයක් මෙම විමර්ශනය සඳහා භාවිතා කෙරේ. 1981 සහ 86 වර්ෂවල ආයතනයෙන් කරන ලද සමීක්ෂණ මෙහිදී මෙහෙවින් ඉවහල් විය.

**ජනගහනය**


කිරිඳිඔය ව්‍යාපෘතිය සමග පෙදෙසේ ඇතිවූ ප්‍රධාන වෙනසක් වන්නේ ඉතා ක්ෂණිකව ජනගහණයේ ප්‍රමාණය වෙනස් වීමයි. පදිංචිය සඳහා පැමිණි නව ගොවි පවුල් මෙන්ම කෘෂි හා ව්‍යාපෘති ආශ්‍රිත රැකියා පතා ප්‍රදේශයට සංක්‍රමණයවූ වෙනත් පුද්ගලයින්ද මෙම ක්ෂණික ජනගහන වෙනස් වීමට හේතු විය. ප්‍රදේශය තුළ ජනගහන වර්ධනයක් ඇතිවූ අතරම, වයස් ව්‍යුහයේද වෙනස්කම් ඇතිවිය. 1981 දී නව මෙන්ම පැරණි සංවර්ධිත පෙදෙස්වල ජනගහනයෙන් වැඩි කොටසක් වයස අවුරුදු 14 ට අඩු අය විය. එහෙත් 1986 වන විට ජනගහනයේ වැඩි කොටස වූයේ වයස අවුරුදු 20 ත් 39 ත් අතර වූ අයයි. 1981 දී 5.75 ක්වූ පැරණි සංවර්ධිත පෙදෙසේ සාමාන්‍ය පවුලක ප්‍රමාණය 1986 දී 6.16 දක්වා ඉහළ නැග ඇති අතර, නව සංවර්ධිත පෙදෙසේ පවුලක ප්‍රමාණය 1981 දී වූ 5.69 සිට 5.28 දක්වා පහළ බැස ඇත. නව සංවර්ධිත පෙදෙසේ පවුලේ ප්‍රමාණය අඩු වීමට හේතු දෙකක් බල පෑව හැක. එකක් තෝරාගත් ගොවිපවුල් නැවත පදිංචිකරන විට පැරණි පවුල් තුළ සිටි තරුණ අය තුළින් නව පරම්පරාවේ නව පවුල් ඇතිවීමය. අනෙක දුෂ්කර තත්ත්වයන් යටතේ පිටින් පැමිණි පවුල්

තම පවුලේ සියළුම සාමාජිකයින් ප්‍රදේශයට [illegible]ශ්‍රිත නො ඒමය. සාපේක්ෂ වශයෙන් බලන විට පැරණි වාරි ප්‍රදේශවල ජනගහනයෙන් වැඩි දෙනෙක් පිරිමි බවත්, නියැදි කුටුම්භවල පවුලේ නොවන පිරිමි නෑයන් වැඩි දෙනෙකු වෙසෙන ලද බවත් 1986 දී ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් කරන ලද සමීක්ෂණයෙන් පැහැදිලි විය.

මෙසේ ඇතිව තිබෙන ජනගහන ව්‍යුහයේ ප්‍රධාන වෙනස්කම් වලට හේතු අතර නව ප්‍රදේශ තුළ දුෂ්කර තත්ත්වයක් යටතේ ජීවත් වීමට පවුලේ පාසැල් යන හා ළදරු ජනගහනය සහ මහළු සහ ස්ත්‍රී සාමාජිකයින් ගොවි පදිංචිකරුවන් විසින් ගෙන නොඒමත් බලපෑවා විය හැක. අනෙක් අතට පැරණි සංවර්ධිත පෙදෙස්වල පිරිමි සාමාජිකත්වය වැඩි වීමට ව්‍යාපෘතිය යටතේ ඇරුනු නව රැකියා අවස්ථා, විශේෂයෙන්ම කෘෂි රැකියා අවස්ථා බලපෑවා විය හැක.

**අධ්‍යාපනය**

ප්‍රජාවක අධ්‍යාපන තත්ත්වය එක්තරා මට්ටමකින් එහි ජීවන තත්ත්වයත් ඒ සඳහා ප්‍රජාව තුළ ඇති අවස්ථා මෙන්ම නවීකරණය පිළිබඳ අදහස් ප්‍රචලිත කිරීමට ඇති මූලික ඉඩකඩක් පෙන්නුම් කරයි. සමස්ථයක් වශයෙන් බලන විට ප්‍රදේශය තුළ ගොවි පවුල්වල අධ්‍යාපන තත්ත්වයේ ඉහළ යාමක් දක්නට ලැබේ. උදාහරණයක් වශයෙන් නව සහ පැරණි ප්‍රජාවන් අතර කියවීමට හා ලිවීමට හැකියාවක් ඇති ගැහැණු පිරිමි දෙපක්ෂයේ ප්‍රතිශතය 1981 ට වඩා 1986 දී ඉහළ ගොස් තිබූ අතර පාසැල් යන වයසේ සිටින ළමයින්ගේ පාසැල් පැමිණීම හෝ අධ්‍යයන කටයුතුවල යෙදීම ඉහළ ගොස් තිබුණි. අධ්‍යාපනය සම්බන්ධයෙන් මෙසේ ඇතිවූ විපර්යාසයට ජාතික අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතිව ඇති නැඹියාවන් මෙන්ම ව්‍යාපෘතියේ සහයෝගය [illegible] වඩ වඩා [illegible] මද [illegible] වේ. මේ සම්බන්ධයෙන් [illegible] පෙනෙන [illegible]



නැම්යාවෙන් දක්නට ලැබෙන්නේ නව සංවර්ධිත පෙදෙසේය.

## ආදායම්

කිරිඳිඔය ප්‍රජාවේ ඇතිවෙමින් පවතින සමාජ විපර්යාසය විදහා දැක්වෙන තවත් එක් අංශයක් වන්නේ ආදායම් මට්ටම් හා එහි සංයුතියයි. ඒක පුද්ගල ආදායම දර්ශකයක් වශයෙන් භාවිතා කරන විට පෙනී යන්නේ ආදායම් වර්ධනයක් ඇතිවී තිබෙන බවයි. උදාහරණ වශයෙන් 1970/80 වර්ෂය තුළ නව වාරපෝෂිත ප්‍රදේශයේ මාසික ඒක පුද්ගල ආදායම රුපියල් 95 ක්වූ අතර 1985/86 වර්ෂය තුළ එය රුපියල් 205 දක්වා ඉහළ නැගී තිබුණි. දෙන ලද කාලය තුළ පැරණි වාරිපෝෂිත පෙදෙසේ මාසික ඒක පුද්ගල ආදායම රුපියල් 114 සිට රුපියල් 440 දක්වා ඉහළ නැග තිබුණි. නව සංවර්ධිත පෙදෙසේ ආදායම සාපේක්ෂ වශයෙන් අධි ප්‍රවේගයකින් හෝ සීඝ්‍රතාවයකින් වර්ධනය වීමට හේතුව වශයෙන් පෙනී යන්නේ බලාපොරොත්තුවන මූලික කටයුත්තවූ කෘෂිකර්මයේ යෙදීමට මේ වන විටත් එහි ගොවි ප්‍රජාවට අවස්ථාවක් නොලැබීමය. 1986 යල කන්නයේද නව සංවර්ධිත පෙදෙසේ ගොවි පවුල් සමහරකට වී ගොවිතැනෙහි යෙදීමට අවස්ථාව ලැබුන අතර, සමස්ථයක් වශයෙන් යල කන්නයේදී මාසික ඒක පුද්ගල ආදායම රුපියල් 303 දක්වා ඉහළ නැගුණි. මින් පෙනෙන්නේ නව සංවර්ධිත පෙදෙස්වල ගොවි ප්‍රජාවට කෘෂිකර්ම ද්‍රව්‍ය ලබාදී ඇතද, එය බොහෝ පවුල්වලට ලදයේ ඇති වැදගත්කමයි.

තම ගම් පියෙස්, ගෙවල් දොරවල්, මෙන්ම ආදායම් මාර්ග සහ සමහර විට ඉඩ කඩම්ද අත හැර නව ප්‍රදේශයක පදිංචියට පැමිණි නව වාරිපෝෂිත ප්‍රදේශයේ ගොවියන්ට ඇතිවන ආර්ථික දුෂ්කරතා අපමණ බව පිළිගත යුතුය. එහෙත් ඉඩම් හා වාරිමාර්ග සංවර්ධනය කිරීමට පෙර ගොවි පවුල් පදිංචි කරවීම අරඹන ලද්දේ නව ප්‍රදේශයට ඔවුන් හුරුපුරුදු වීම උදෙසාය. ඔවුනට මෙහිදී නව ප්‍රදේශයේදී තම ජීවන මට්ටම නව දුරටත් සාමාන්‍ය මට්ටමකින් හෝ පවත්වා ගැනීමට කරුණු කිහිපයක් හේතු වූ බව පෙනේ. මින් වැදගත්ම කරුණ වන්නේ නව වාරිපෝෂිත ප්‍රදේශවල ගොවි පවුල්වලට ලැබුන ආහාර මුද්දර ඇතුළු පිහිටාධාරය. මෙහි ගොවි පවුල්වල වාර්ෂික ආදායමින් 40% ක්ම සංයුක්ත වූයේ මෙම පිහිටාධාර වල වටිනාකමිනි. මෙය, 1986 යල කන්නයේ භෝග ආදායම් සමග 35% දක්වා අඩුවිය. පැරණි වාරි පෝෂිත ප්‍රදේශවල පිහිටාධාර වල වටිනාකම මුළු පවුලේ වාර්ෂික ආදායමින් 2% කටත් වඩා අඩුවිය. මීට අමතරව කුලී ශ්‍රමිකයන් වශයෙන් වැඩ කිරීමෙන් වෙනත් ස්වයං රැකියාවලින් සහ අතිරේක ආහාර භෝග වගාවෙන් ජීවනෝපාය රැක ගැනීමට නව ප්‍රදේශවල ගොවි පවුල්වලට සිදුවිය. සාපේක්ෂක වශයෙන් බලන විට පැරණි වාරි පෝෂිත ප්‍රදේශවල කෘෂිකාර්මික ආදායම් මුළු වාර්ෂික ආදායම් සංයුතියෙන් 70% ක් පමණ වූ බව පෙනී ගියේය.

ආහාර මුද්දර ලබා දීමට උපයෝගී කර ගන්නා පවුල් ආදායම් නිර්ණායකයක් වශයෙන් ගෙන දුප්පත්කමේ පැතිරීම නිර්ණය කිරීම සුලභ දෙයකි. මෙසේ දුප්පත්කමේ ප්‍රමාණය නිර්ණය කර බලන විට 1981 දී නව වාරිපෝෂිත ප්‍රදේශවල දුප්පත් ගනයේ ලා සැලකූ පවුල් 44% ක් පමණවූ අතර මෙය 1985/86 මහ කන්නයේදී 46% දක්වා ඉහළ නැග යල වී ආදායම් සමග 16% දක්වා පහත බැස තිබුණි. වර්ෂ පහක පමණ කාලයක් තුළ මෙම පෙදෙසේ ගොවි ආර්ථිකයේ පැහැදිලි නැම්යාවක් ඇති වී නොමැති බව මින් පෙනේ. මෙයට හේතු කිහිපයක් බලපෑව හැක. ව්‍යාපෘතියට පෙර එම පෙදෙසේ පදිංචිව සිටි අයගේ ආර්ථිකය විශේෂයෙන් හේන් වගාව මුල්කර ගත් කෘෂි ආර්ථිකය ව්‍යාපෘතිය නිසා මෙම කාලය තුළ බිඳ වැටීම එක් හේතුවකි. අනෙක් අතට බලාපොරොත්තු පරිදි වරිමාර්ග කෘෂිකර්මයට එළඹීමට ලැබුන අවස්ථා මේ දක්වා අඩුවීම තවත් කරුණකි.

## නිවාස තත්ත්වය

ප්‍රජාවක නිවාස තත්ත්වය සහ සනීපාරක්ෂක පහසුකම් ඔවුන්ගේ ජීවන තත්ත්වය මෙන්ම සමාජ සංවර්ධනය පෙන්වන මානයක් වශයෙන් සැලකිය හැක. 1986 ව්‍යාපෘති පෙදෙසේ නිවාස වැඩි ප්‍රමාණයක් වර්ග අඩි 500 ට අඩු ඒවා විය. 1981 දී නව වාරි පෝෂිත පෙදෙස්වල වර්ග අඩි 250 ට අඩු ප්‍රමාණයේ නිවාස 16% ක්වූ අතර 1986 වන විට එම ප්‍රදේශයේ මෙම ප්‍රමාණයේ නිවාස 39% දක්වා ඉහළ යාමක් දක්නට ලැබුණි. මේ සමග

සසඳා බලන විට පැරණි වාරිපෝෂිත ප්‍රදේශවල නිවාස ක්‍රම ක්‍රමයෙන් විශාලවන බව පෙනී යයි. නව වාරිපෝෂිත ප්‍රදේශයේ බොහෝමයක්ම නිවාස පොල් අතු, සෙවිලි කළ, මැටි ගැසූ ඒවාවූ අතර ඉන් කොටසක් ඉවුම් පිහුම් කටයුතු සඳහා භාවිතාකළ බව පෙනේ. අනෙක් අතට පැරණි වාරිපෝෂිත ප්‍රදේශයේ බොහොමයක් නිවෙස්වල වෙනම කුස්සියක් තිබීමෙන් පෙනී යන්නේ සාපේක්ෂ වශයෙන් ඉහළ ජීවන මට්ටමක් තිබීමයි. නව වාරිපෝෂිත ප්‍රදේශයේ අනිස්ථිර සහ ප්‍රමාණයෙන් කුඩා නිවාස වැඩිවීමට හේතුව සියළුම ගොවි පවුල්වලට නැවත පදිංචිවීම යටතේ නව නිවහන් තනා ගැනීමට සිදුවීමය. මෙහිදී ව්‍යාපෘතිය යටතේ මූලික අමු ද්‍රව්‍ය ගැනීමට රුපියල් 1500/- ක් පමණ මුදලක් හෝ සමාන වටිනාකමින් යුත් ද්‍රව්‍ය ලබාදී ඇතද, එය බොහෝ පවුල්වලට දෙන ලද කටයුත්ත සඳහා බෙහෙවින් ප්‍රමාණවත් නොවූ බව පෙනුනි.

### සනීපාරක්ෂක පහසුකම්

නිවාස මෙන්ම, පානය සඳහා පිරිසිදු ජලය ලබා ගැනීමේ පහසුකම්ද, සනීපාරක්ෂාව සඳහා පිළිගත හැකි මට්ටමක වැසිකිළි පහසුකම් තිබීමද යම්කිසි ප්‍රජාවක ජීවන තත්ත්වය විදහා දක්වන තවත් වක්‍ර දර්ශනයකි. පැරණි වාරිපෝෂිත ප්‍රදේශයේ ළිං වලින් ජලය පානය කරන පවුල් ගණන 1981 දී 80% ක්වූ අතර 1986 දී එම කොටස 97% දක්වා ඉහළ නැග තිබුණි. එසේම දෙන ලද කාලය තුළ නව පෙදෙසේ වැසිකිළි භාවිතය 49% සිට 70% දක්වා ඉහළ නැග තිබුණි. මෙම නැමියාවන් හිතකර බව කිව යුතුය. සාපේක්ෂ වශයෙන් බලන විට 1981 දී නව වාරිපෝෂිත පෙදෙසේ පවුල් 63% ළිං ජලය භාවිතා කළ අතර, 1986 දී ළිං ජලය භාවිතා කිරීමට අවස්ථාව තිබුනේ 42% කට පමණි. මෙහි වැඩි ජනගහනයක් බීම සඳහා භාවිතා කළේ ව්‍යාපෘතිය මගින් බව්සර් උපයෝගී කර ගෙන බෙදා දෙන ජල සලාක යයි. පවුලකට දෙන ලද ජල සලාකය අතිශයින් අප්‍රමාණවත් බවත්, බෙදා හැරීම අක්‍රමවත් බවත්, ගොවි පවුල් ඉන් සෑහීමකට පත් නොවූ බවත් 1986 සමීක්ෂණයෙන් හෙළිවිය. කෙසේ වුව ව්‍යාපෘතිය මගින් බීමට ජලය සැපයීමට ගෙන ඇති පියවර පැසසිය යුත්තේ අනාරක්ෂිත හෝ අපිරිසිදු ජල පානයෙන් ඇතිවන රෝග ප්‍රදේශය තුළ සාමාන්‍යයෙන් බලාපොරොත්තු විය හැකි තත්ත්වයට වඩා සපේක්ෂක වශයෙන් අඩුවූ බව පැහැදිලි වීමෙනි. අනෙක් අතට 1981 දීට වඩා 1986 වන විට මූලික ප්‍රදේශ දෙක තුළම වැව් හෝ ගංගා ජලය බීමට ගන්නා ප්‍රමාණය අතිශයින් අඩුවී තිබීම සමාජ සංවර්ධන අංශයෙන් බලන විට හොඳ නැමියාවක් පෙන්නුම් කරයි.

### ගෘහ උපකරණ

ආදායම්, නිවෙස් සහ සනීපාරක්ෂක පහසුකම් හා ඒවායේ තත්ත්වය මෙන්ම නිවෙස්වල ප්‍රයෝජනය සඳහා භාවිතා කෙරෙන ගෘහ භාණ්ඩද යම්තාක් දුරට යම්කිසි ප්‍රජාවක ජීවන තත්ත්වය පිළිබිඹු කරයි. පැට්‍රල් ලාම්පු, ගුවන් විදුලි යන්ත්‍ර, මහන මැෂින් සහ පාපැදි වැනි එදිනෙදා ගෘහ ජීවිතයේ වැදගත් උපකරණ හා භාණ්ඩ වැනි දෑ සලකා බලන විට පැරණි වාරිපෝෂිත ප්‍රදේශවලට වඩා නව වාරිපෝෂිත පෙදෙසේ නිවෙස්වල ඉහත කී දෑ අඩුවෙන් දක්නට ලැබුණි. මෙහිදී බලපාන මූලික සාධකය ලෙස පෙනී ගියේ තවමත් පහළ මට්ටමක පවතින ආර්ථික තත්ත්වයයි.

### ප්‍රජා සංවිධාන සහ ආයතන

ප්‍රජා සංවිධානවල වර්ධනය සම්බන්ධයෙන් බලන විටද නව වාරිපෝෂිත පෙදෙස්වල ප්‍රජාව සාපේක්ෂක වශයෙන් ඌණ සංවර්ධිත ලක්ෂණ විදහා පායි. ප්‍රජා හෝ ගම් මට්ටමේ සංවිධාන බිහි වන්නේ සමාජ හා ආර්ථික සම්බන්ධතා තුළින් මතුවන එකමුතු භාවය, ප්‍රජාවේ පොදු අවශ්‍යතා හඳුනා ගැනීමට ඇති හැකියාව හා මාර්ග සම්බන්ධව සලකා බැලීමට ඇති හැකියාව තුළිනි. ග්‍රාම සංවර්ධන සමිති, ප්‍රජා මණ්ඩල, ආගම් මත පදනම්වූ සමිති, මරණාධාර සමිති මෙන්ම ගොවි සංවිධාන වශයෙන් සලකා බලන විට, නව වාරිපෝෂිත ප්‍රජාව තුළ මෙම සංවිධාන පවතින බව හා ඒවායේ සහභාගිවන බව සමීක්ෂණයේදී වාර්තා වූයේ සාපේක්ෂක වශයෙන් අඩුවෙනි. මෙහිදී මෙම ප්‍රජා සාපේක්ෂක වශයෙන් නවක ජනගහනයක් වීමත්, භෞතික වශයෙන් නිතර චලනය වීමත් මෙයට හේතුවූවා විය හැක.

### ප්‍රජා සේවා සහ පහසුකම්

ප්‍රජා ජීවිතය හා එහි ගුණය කෙරෙහි පරිසරයේ ලක්ෂණ මෙන්ම එය තුළ සපයා දෙන සේවා සහ පහසුකම්ද ඉතා වැදගත් වේ. නව වාරිපෝෂිත ප්‍රදේශය වශයෙන් අද හැඳින්විය හැකි ප්‍රදේශය ව්‍යාපෘතියේ මැදිහත් වීමට පෙර

(32 පිටුව බලන්න)

24 වන පිටුවෙන්

තිබුනේ ගේන් එගාව වැනි ප්‍රාථමික ආර්ථික කටයුතු මූල්කර ගත් නොදියුණු ප්‍රදේශයක් වශයෙනි. ජනගහනයේ පැතිරීම ඉතා අල්පවූ අතර මූලික සේවා සහ පහසුකම් ඉතාම මදවිය. ව්‍යාපෘතියේ මැදිහත් වීමෙන් ඉඩම් හා වාරි මාර්ග සංවර්ධනය කිරීමට පියවර ගත්තා පමණක් නොව, ඒ තුළ පිහිටවන නව ප්‍රජාවේ ආර්ථික හා සමාජ සංවර්ධනය සදහා උපකාරී වන මාර්ග, පාසැල්, සෞඛ්‍ය, වෙළඳපල, තැපැල්, බැංකු හා වෙනත් සේවා සහ පහසුකම්ද සැපසිමට කටයුතු කෙරිනි. ව්‍යාපෘතිය යටතේ ඉහත කී සේවා සහ පහසුකම් භූගෝලීය වශයෙන් වඩා ආසන්න ස්ථානවල පිහිටුවා ඇති අතර ව්‍යාපෘතියට පෙර තිබූ තත්ත්වය හා සසඳා බලන විට එම ප්‍රදේශය සංවර්ධනයේ මගට එළඹෙමින් තිබෙන බව පෙන්නුම්කරයි. එහෙත් ඉහත කී සේවා සහ පහසුකම්වල තත්ත්වය පැරණි වාරිපෝෂිත ප්‍රදේශවල තත්ත්වයටම පවතියයි කිව නොහැක. උදාහරණ වශයෙන් බලන විට යම්කිසි දෙන ලද සේවයක් ලබාගැනීමට නව වාරිපෝෂිත පෙදෙස් නිවැසියකුට පැරණි වාරිපෝෂිත පෙදෙසේ නිවැසියකුට වඩා වැඩි දුරක් ගමන් කිරීමට සිදුවිය.

සමාජ හා ආර්ථික සංවර්ධනයේ ප්‍රතිඵල ලෙස මිනිස් අවශ්‍යතා ඉහළ යන අතර ඒවා ලබාගැනීමට ඇති ආර්ථික හැකියාවන්ද ඉහළ යයි. නව වෙළෙඳපල, විවිධ සේවා සැපයෙන සමාජ, පුද්ගලික හෝ රජයේ ආයතන, සංවිධාන හා ව්‍යවසාය බිහිවන්නේ මේ අනුවයි. පරිවහනය බලන විට පැරණි වාරිපෝෂිත පෙදෙසේ බස් හා වෙනත් මගී වාහන පරිවහනය සදහා ප්‍රචලිත වූ අතර නව වාරිපෝෂිත පෙදෙසේ ට්‍රැක්ටර් මගින් පරිවහනය වැදගත්ව කැපී පෙනුණි. අනෙක් අතට බලන විට කරණවෑමි හල්, බයිසිකල් නඩත්තු ස්ථාන, ආගමික මධ්‍යස්ථාන වැනි දෑ සදහාද නව වාරිපෝෂිත පෙදෙස්වල ජනයාට වැඩි ඈත යාමට සිදුවිය. මෙනයින් බලන විට ස්වභාවික, සමාජ හා ආර්ථික සංවර්ධන මට්ටමකට නව වාරිපෝෂිත පෙදෙස් ලංවීමට නම් තවත් සෑහෙන කලක් යනු ඇති බව පෙනේ. එතෙකුදු වුව ව්‍යාපෘතියේ මැදිහත්වීම තුළින් කෙටි කාලයක් තුළ ක්‍රියාත්මක කරන ලද සේවා සහ පහසුකම් මෙම දීර්ඝ ගමන කෙටි කිරීමකට තුඩු දී ඇති බවද පෙනී යයි. මෙම කලය තවත් කෙටි කිරීමට නම් මාර්ග සහ පරිවහන, පහසුකම් මෙන්ම බීමට ජලය ලබාදීමට ක්‍රමවත් මාර්ගද යොදාගත යුතු අතර නිවාස සංවර්ධන වැඩ පිළිවෙලක්ද දියත් කළ යුතුය. ව්‍යාපෘතියේ අපේක්ෂාවන් පරිදි වාරි මාර්ග පදනම් කොටගත් කෘෂි සංවර්ධනයද මෙහිදී බෙහෙවින් ඉවහල් වනු ඇත.